**හිතවත් ගනුදෙනුකරුවනි,**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු සැලසුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබඳව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබඳව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2 යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [+94(0)114711411] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තර | ගනුදෙනුකරුවන් ට ලැබෙන ප්‍රතිලාභ | ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු | ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **අ) ළමා ගිණුම්** | | | | |
| **නේෂන්ස් ළමා ඉතුරුම් ගිණුම**<br><br>මෙම ගිණුම අවුරුදු 18ට අඩු දරුවෙකු වෙනුවෙන් දෙමාපියන්ට හෝ නීත්‍යානුකූල භාරකරුවෙකුට විවෘත කළ හැකිය. | • මනාපය පරිදි තෝරාගත හැකි පොලී අනුපාතය.<br><br>• ශේෂය පදනම් කරගත් තෑගි.<br><br>• පුද්ගලික බැංකුකරණය සහ ඉනර් සර්කල්හි (Inner Circle) කනිෂ්ඨ සාමාජිකත්වය. | ගිණුම වසා දැමීමේ ගාස්තුව. | • ළමා ඉතුරුම් ගිණුමක් විවෘත කිරීමේ පෝරම සම්පූර්ණ කළ යුතු අතර පහත සඳහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය:<br><br>• පරීක්ෂා කිරීම සඳහා දරුවාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත.<br><br>• දෙමාපියන්ගේ / භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි පිටපතක්<br><br>• ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනය පදිංචි ලිපින යෙන් වෙනස් නම් ලිපින ය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ. | • අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකිකයකු වන දරුවාගේ මාපියකු හෝ භාරකරුවෙකු විසින් දරුවා වෙනුවෙන් ගිණුම විවෘත කළ හැකිය."<br><br>• වලංගු ලියකියවිලි මත පදනම්ව සහ බැංකුවේ අභිමතය පරිදි තීරණාත්මක අවශ්‍යතා, එනම් අධ්‍යාපනය සහ වෛද්‍යමය හේතූන් සඳහා පමණක් මුදල් ආපසු ගැනීම්වලට අවසර දෙනු ලැබේ.<br><br>• බාල වයස්කරුට, තමා වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු, ගිණුමේ ඇති මුදල් ලබා ගැනීමට හෝ සුදුසු පරිදි වෙනත් වැඩිහිටි ගිණුමකට පරිවර්තනය කිරීමට අයිතියක් ඇත. |

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් ළමා ඉතුරුම් ගිණුමට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසිය යටතේ **https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf** හි දක්වා ඇත.
- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.
- මෙම බැංකුව, රු. 1,100,000/- ක් දක්වා තැන්පත් කරන එක් තැන්පත්කරුවකුට රැකවරණය සපයනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ (SLDIS) සාමාජිකයෙකු වේ.
- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් බලපැවැත්විය යුත්තේ මෙහි ඉංග්‍රීසි පිටපතයි.